# වරදෙහි බැඳුන ගැහැණිය

## සාංදෘෂ්ටික දර්ශනයේ ඡායාවක්

ජයසුමන දිසානායක

ඇල්බර්(ට්) කැමූ ගේ The Adulterous woman කෙටි කතාවේ පරිවර්තනය සහ විවරණය.

නවකථාකරුවෙකු, දාර්ශනික ලේඛකයෙකු, නාට්‍ය රචකයෙකු වූ ඇල්බර්(ට්) කැමූ 1913 දී ප්‍රංශ ඇල්ජීරියාවේ උපත ලැබීය. ඇල්ජීරියානු විශ්ව විද්‍යාලයෙන් උපාධිය හැදෑරූ හේ 1940 වන තුරුම ඇල්ජීරියාවේ, විවිධ වෘත්තීන්හි යෙදෙමින් විසීය. ඉන්පසු පැරිසියට පැමිණ පුවත්පත් කලාවේදියෙකු ලෙස කටයුතු කරමින්, ප්‍රංශ ප්‍රතිවිරෝධී ව්‍යාපාරයෙහි ක්‍රියාකාරී සාමාජිකයෙකු විය. ඔහුගේ ප්‍රථම නවකතාව "L" Etranger" (1942) ඇල්ජීරියා පසුබිම්කොට ලියුවකි. එය " The Stranger" (1946) පසුව " Out sider" නමින් ඉංග්‍රීසියට නැගුනු අතර, ඉන් විශාල කීර්තියක් ඔහුට ලැබුණේ එය උසස් ගණයේ නවකථාවක් ලෙස අගය කෙරුන බැවිනි. ෂෝන් පෝල් සාත්‍රෙ විසින් ඉස්මතු කරන ලද සාංදෘෂ්ටිකවාදය විග්‍රහ කරමින් කැමූ ලියූ " Le Mythe de Sisypie" " සිසිපස් පුරාණය " කෘතිය, විශ්වය තුළ මිනිසාගේ පැවැත්ම අර්ථශූන්‍ය, අසම්මත වූවක් බැව් ඉස්මතු කිරීමකි.

ඔහු පසුව ලියූ නවකතා තුනම විචාරක අවධානයට යොමු විය. ඔහු නිර්මාණය කළ නාට්‍ය කීපයක් නිව්යෝර්ක්හි රංගශාලාවන්හටද යෙදිණි. 1957 දී සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලද හේ 1960 දී රිය අනතුරකින් මිය ගියේය.

බස් රියෙහි තදුළු එසා තිබුණත්, යැනෙත වෙලුවක සිට ගෙමිසේගේ ඒ තුළ එහා මෙහා පියාඹමින් සිටියි. වෙහෙසට පත් ඌ පියාපත් සළමින්, එහා මෙහා